4861

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2017**

| | | | |
|---|---|---|---|
| භූගෝල විද්‍යාව | I, II | | පැය තුනයි |
| புவியியல் | I, II | | மூன்று மணித்தியாலம் |
| Geography | I, II | | *Three hours* |

**විභාග අංකය :** ..............................

## භූගෝල විද්‍යාව I

※ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
※ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **10** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න**.

**1.** වායුගෝලයේ විද්‍යුත් ක්‍රියාවලීන් බහුලව සිදු වන්නේ ......................................ගෝලය තුළ ය.
(මෙසෝ / පරිවර්තී / තාප)

**2.** වර්ෂාවෙන් හෝ හිම දියවීමෙන් පසු පෘථිවි අභ්‍යන්තරයට කිඳා බසින ජලය ...................................... ජලය යනුවෙන් හැඳින්වේ.
(සහජාත / මැග්මීය / උල්කා)

**3.** මෑතක දී සක්‍රීය තත්ත්වයට පත් වූ හෙක්ලා ගිනිකන්ද පිහිටියේ .......................................... ය.
(ජපානයේ / අයිස්ලන්තයේ / සිසිලියේ)

**4.** වැලි කාන්තාර ආශ්‍රිතව දක්නට ලැබෙන භූ රූපයක් වන්නේ .......................................... ය.
(ඩ්‍රම්ලින් / සොයිගම / මැටර්හෝන්)

**5.** රුසියාවේ පිහිටි සෞම්‍ය කලාපික තෘණභූමි .......................................... නමින් හැඳින්වේ.
(ස්ටෙප්ස් / වෙල්ඩ් / ටායිගා)

**6.** ශ්‍රී ලංකාවේ ................................................. වනාන්තර වසරකට මි.මී. 2000 ට වැඩි වර්ෂාපතනයක් ලබයි.
(වියළි මිශ්‍ර සදාහරිත / නිවර්තන තෙත් / කඳුකර)

**7.** වී වගාව සඳහා වඩාත් උචිත වන්නේ ........................................ පස ය.
(දියළු මිශ්‍ර මැටි / ලුණු මිශ්‍ර වැලි / ලෝම හා ලැටරයිට්)

**8.** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය කෙරෙහි බලපා ඇති සමාජයීය සාධකයකට නිදසුනක් ලෙස ................................ දැක්විය හැකි ය.
(සේවා පහසුකම් / කර්මාන්ත / රාජ්‍ය ප්‍රතිපත්ති)

**9.** ශ්‍රී ලංකාවේ පුරාණ වැව් ගම්මානවල නිවාස පිහිටා තිබුණේ ........................................ ආකාරයට ය.
(පොකුරු / රේඛීය / විසිරුණු)

**10.** එක් පෝෂක ප්‍රදේශයකින් ආරම්භ වී විවිධ දිශාවන්ට ගංගා ගලා බැසීම නිසා .......................................... ජලවහන රටාවක් නිර්මාණය වේ.
(ශාඛීය / අරීය / ජාලාකාර)

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

- අංක 11 සිට 20 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් **නි** යන්න වටා ද, වැරදි නම් **වැ** යන්න වටා ද රවුමක් අඳින්න.

**11.** උන්නතාංශය සමග උෂ්ණත්වය අඩු වී යාම පරිවර්තී ගෝලයේ විශේෂ ලක්ෂණයකි. **නි / වැ**

**12.** පෘථිවියේ ඇතුළත හරය යකඩ හෝ නිකල් සංයුතියකින් සෑදී ඇතැයි විශ්වාස කෙරේ. **නි / වැ**

**13.** පෘථිවි අභ්‍යන්තරයේ සිට සිරස් අතට සිදු වන තෙරපීම හේතු කොට ගෙන විභේද නිර්මාණය වේ. **නි / වැ**

**14.** කෙපන්ගේ දේශගුණ වර්ගීකරණය අනුව නිවර්තන දේශගුණ වර්ගයට අයත් උපවර්ගයක් ලෙස නිවර්තන වර්ෂා වනාන්තර වැදගත් වේ. **නි / වැ**

**15.** කියුබාව, බ්‍රසීලය, චීනය හා ඉන්දියාව ලෝකයේ උක් සීනි නිපදවන රටවල් අතර ප්‍රමුඛ වේ. **නි / වැ**

**16.** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙන් 70%ක් ම නාගරික ප්‍රදේශවල හා වතු ප්‍රදේශවල ජීවත් වේ. **නි / වැ**

**17.** මැන්චෙස්ටර්, ලිවර්පූල් සහ ග්ලාස්ගෝ යනු ඇමෙරිකා එක්සත් ජනපදයේ යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන වේ. **නි / වැ**

**18.** 'කඩොලාන' වෙරළබඩ පරිසර පද්ධතියට අනුවර්තනය වූ ශාක ප්‍රජාවකි. **නි / වැ**

**19.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ වෙළෙඳාම හා ප්‍රවාහනයේ මැදිහත්කරු ලෙස සන්නිවේදන ජාලය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. **නි / වැ**

**20.** මෑත කාලයේ ලෝකයේ ස්වාභාවික විපත් බහුල ම කලාපය ලෙස ආසියාව හඳුනාගෙන ඇත. **නි / වැ**

- අංක **21** සිට **30** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**21.** පෘථිවියේ ශාක, සත්ත්ව හා ක්ෂුද්‍රජීවීන් වාසය කරන ස්තරය .......................................... ගෝලය ලෙස හැඳින්වේ.

**22.** පොළෝ තලයෙන් 71% පමණ ...................................... ගෝලයට අයත් වේ.

**23.** පෘථිවි ගෝලයේ මතුපිට ඇති තුනී ස්තරය .......................................... නමින් හැඳින්වේ.

**24.** ...................................... පස තිරිඟු වගාව සඳහා වැදගත් ම සාධකයක් වේ.


**25.** ශ්‍රී ලංකාවේ වී වගාව අඩුවෙන් ම ව්‍යාප්ත වී ඇත්තේ ...................................... දිස්ත්‍රික්කයේ ය.

**26.** නියත රසායනික සංයුතියක් ඇති ස්වාභාවික අකාබනික ද්‍රව්‍ය .................................. ලෙස හැඳින්වේ.

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

- අංක **27** සිට **30** තෙක් ප්‍රශ්නවලට පහත දී ඇති රූපසටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.




**27.** රූපසටහනෙහි **A-B** රේඛාවෙන් දැක්වෙන්නේ ............................................. බෑවුමකි.

**28.** රූපසටහනෙහි **C-D** රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය ........................................... ය.

**29.** රූපසටහනෙහි **E-F** රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය ...................................... වේ.

**30.** රූපසටහනෙන් දැක්වෙන ප්‍රදේශයෙහි පවතිනුයේ ............................................ ජලවහන රටාවකි.

- අංක **31** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා, ඊට හිමි **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර මත ලියා දක්වන්න.**

**31.** වායුගෝලයත්, ජලගෝලයත් අතර ජලය හුවමාරුවීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ
(1) ජල චක්‍රය යනුවෙනි. (2) වාෂ්පීකරණය යනුවෙනි.
(3) උත්ස්වේදනය යනුවෙනි. (4) ඝනීභවනය යනුවෙනි. (.........)

**32.** සබරගමුව කඳු පන්තියට අයත් කඳු ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) කොකාගල, නුවරගල (2) කුකුළුගල, ගොන්ගල
(3) ගෝවින්දහෙළ, හිනිදුම (4) ඉඟිනියාගල, කුකුළුගල (.........)

**33.** ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග ව්‍යාප්තිය වැඩි ම දිස්ත්‍රික්ක දෙක වන්නේ
(1) මාතලේ හා රත්නපුරයයි. (2) ගම්පහ හා කෑගල්ලයි.
(3) මාතලේ හා මහනුවරයි. (4) රත්නපුර හා කෑගල්ලයි. (.........)

**34.** යළි භාවිතයට ගත හැකි සම්පත් යුගලය වන්නේ
(1) ගස්වැල් හා ඛනිජ ය. (2) පස හා ලෝහ ය.
(3) වන ජීවීන් හා පෙට්‍රෝලියම් ය. (4) භූමිය හා පස ය. (.........)

**35.** අත්ලාන්තික් සාගරය හා පැසිපික් සාගරය සම්බන්ධ කරන ඇළ මාර්ගය
(1) වෙල්ලන්ඩ් ය. (2) කීල් ය. (3) පැනමා ය. (4) සූවස් ය. (.........)

[හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**36.** පහත **I තීරුවේ** ඛනිජ වර්ග කිහිපයක නම් ද, **II තීරුවේ** ඒවා ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ කිහිපයක් ද දක්වා ඇත. **I තීරුවේ** අනුපිළිවෙළට අනුව **II තීරුවේ** ප්‍රදේශ පෙළගැස්වූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| **I තීරුව** | **II තීරුව** |
|---|---|
| i. ගල් අඟුරු | A - ඇපලාචියන් කඳු |
| ii. ඛනිජ තෙල් | B - විට්වෝටර්ස් රෑන්ඩ් |
| iii. ටින් | C - සෞදි අරාබිය |
| iv. රන් | D - මැලේසියාව |
| | E - මෙක්සිකෝව |

(1) A, B, C, D (2) A, C, D, B (3) B, D, E, C (4) E, A, D, B (.........)

**37.** ශ්‍රී ලංකාවේ ඉල්මනයිට් ඛනිජය බහුලව නිධිගත වී ඇති ප්‍රදේශ වන්නේ
(1) තිලාවෙලි හා මාරවිල ය. (2) කයිකාවල හා පුල්මුඩේ ය.
(3) ඉරණමඩු හා නාත්තන්ඩිය ය. (4) පුල්මුඩේ හා තිලාවෙලි ය. (.........)

**38.** ජන සංක්‍රමණ කෙරෙහි බලපාන තල්ලු කිරීමේ සාධක යුගලය ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) රැකියා දුලබ වීම, නිවාස හිඟ වීම
(2) රැකියා සුලභ වීම, අධික වායු දූෂණය
(3) හිතකර පරිසරය, අඩු අධ්‍යාපන පහසුකම්
(4) යටිතල පහසුකම් අඩු වීම, උසස් තාක්ෂණ මට්ටම නිසා ලැබෙන වාසි (.........)

**39.** ජීව විද්‍යාත්මක උපද්‍රව දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) නායයාම්, ජල ගැලීම් (2) ලැව්ගිනි, වසංගත රෝග
(3) අකුණු සැර, නියඟ (4) සුළි සුළං, ලැව්ගිනි (.........)

**40.** පොදු අරමුණු සිතියම් දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ශ්‍රී ලංකා බිත්ති සිතියම, ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම
(2) භූ ලක්ෂණ සිතියම, මාර්ග සිතියම
(3) සංචාරක සිතියම, ශ්‍රී ලංකා අඟලේ සිතියම
(4) භූ විද්‍යා සිතියම, ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම (.........)

* *

[පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

## භූගෝල විද්‍යාව II

- ※ මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත ය.
- ※ **I** කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- ※ **II** කොටසින් ප්‍රශ්න **දෙකකටත්**, **III** කොටසින් ප්‍රශ්න **දෙකකටත්** පිළිතුරු සැපයිය යුතු ය.
- ※ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි**.

### I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති 1:50 000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු දීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක **8**) යොදා ගන්න.
අංක (i) සිට (iv) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) අංක ① න් දක්වා ඇත්තේ කුමක් ද?
(කොරල්පරය / වැලිපරය / දිය කඩනය) (ලකුණු 01 යි)

(ii) අංක ② න් දක්වා ඇත්තේ කුමක් ද?
(ගංමෝය / ඩෙල්ටාව / කලපුව) (ලකුණු 01 යි)

(iii) අංක ③ න් දැක්වෙන රෝස පාටින් සේයා කොට ඇති ප්‍රදේශය කුමක් ද?
(සංචාරක කලාපය / සංරක්ෂිත ප්‍රදේශය / ඉදිකළ ප්‍රදේශය) (ලකුණු 01 යි)

(iv) අංක ④ න් දක්වා ඇත්තේ කුමක් ද?
(සංචාරක බංගලාව / හෝටලය / තානායම) (ලකුණු 01 යි)

(v) ප්‍රදේශයේ බහුලව ව්‍යාප්ත වී ඇති ව්‍යාපාරික භෝගය කුමක් ද? (ලකුණු 01 යි)

(vi) **A** සිට **B** දක්වා විහිදෙන පරිපාලන මායිම කුමක් ද? (ලකුණු 01 යි)

(vii) **C - D** වලින් දක්වා ඇත්තේ ගුවන් ධාවන පථයකි. එහි දිග කිලෝමීටරවලින් දක්වන්න. (ලකුණු 01 යි)

(viii) **E** අක්ෂරයෙන් දක්වා ඇති රේඛාව කුමක් ද? (ලකුණු 01 යි)

(ix) **F, G** හා **H** වලින් දක්වා කොටු කර ඇති කලාප තුන අතුරෙන් දෛනිකව විවිධ අවශ්‍යතා සඳහා වැඩිම පිරිසක් ඇදී එතැයි සිතිය හැකි කලාපය කුමක් ද? (ලකුණු 01 යි)

(x) ඉහත **F, G** හා **H** කලාප තුන අතුරෙන් වැඩිම ආගමික විවිධත්වයක් ඇතැයි සිතිය හැකි කලාපය කුමක් ද? (ලකුණු 01 යි)

(ආ) නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිත කොට පහත අංක (i) සිට (v) දක්වා දී ඇති දෑ, සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි (පිටු අංක **9**) **ලකුණු කර නම් කරන්න.**

(i) මරේ-ඩාර්ලින් ගංගාව
(ii) කැලිෆෝර්නියානු අර්ධද්වීපය
(iii) ඇන්ඩීස් කඳුවැටිය
(iv) කලු මුහුද
(v) හඩ්සන් බොක්ක

(ලකුණු 05 යි)

[ගයවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

(ඉ) නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිත කොට පහත (i) සිට (v) දක්වා දී ඇති දෑ, සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි (පිටු අංක 9) **ලකුණු කර නම් කරන්න.**

(i) කල්පිටිය අර්ධද්වීපය

(ii) වලවේ ගඟ

(iii) කුමන කුරුළු අභය භූමිය


(iv) වාලච්චේනයි

(v) මාතලේ නගරය

(ලකුණු 05 යි)

## II කොටස

**2.** පෘථිවි වායුගෝලයෙහි ස්තරවල පිහිටීම දක්වන රූප සටහනක් මෙහි දක්වා ඇත. එය හොඳින් අධ්‍යයනය කර පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





(i) රූප සටහන අනුව වායුගෝලයේ 1 හා 2 ස්තර මොනවාදැයි පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඔබ ඉහත (i) හි නම් කළ 1 ස්තරයෙහි විශේෂ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ජෛවගෝලයෙහි සීමාවන් මොනවාදැයි කෙටියෙන් සඳහන් කරන්න.

(b) ජෛවගෝලයෙහි කැපී පෙනෙන ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

● අංක **3, 4** හා **5** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ලෝක සිතියම ආධාර කර ගන්න.




**3.** (i) ඉහත ලෝක සිතියමෙහි Ⓐ හා Ⓑ අක්ෂරවලින් දක්වා ඇති වනාන්තර වර්ග **දෙක** මොනවාදැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) පතනශීල වනාන්තරවල විශේෂ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ලෝක වන සම්පත් ආරක්ෂා කළ යුත්තේ ඇයිදැයි කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** (i) ඉහත ලෝක සිතියමේ Ⓒ හා Ⓓ වලින් දක්වා ඇත්තේ ලෝකයේ ව්‍යාපාරික වශයෙන් වී වගා කරන ප්‍රදේශ ඇතුළත් ගංගා නිම්න දෙකකි. එම ගංගා නිම්න **දෙක** මොනවාදැයි පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ආසියාතික කලාපයේ රටවල වී වගාව හා නිෂ්පාදනය සම්බන්ධ ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ලෝකයේ වී වගාව හා නිෂ්පාදනය සම්බන්ධ මෑතකාලීන ප්‍රවණතා **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**5.** (i) ඉහත ලෝක සිතියමෙහි Ⓔ හා Ⓕ අක්ෂරවලින් දක්වා ඇත්තේ කපු වගාව කෙරෙන ප්‍රදේශ දෙකකි. එම ප්‍රදේශ අයත් වන රටවල් **දෙක** මොනවා දැයි පිළිවෙළින් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) ලෝකයේ කපු පිළි කර්මාන්තය ප්‍රචලිත වීමට බලපෑ සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)


(iii) කපු පිළි කර්මාන්තයේ මෑතකාලීන ප්‍රවණතා **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

[ හත්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

## III කොටස

6. ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප දැක්වෙන සිතියමක් මෙහි දක්වා ඇත. එය හොඳින් අධ්‍යයනය කර පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) සිතියමෙහි අංක ①න් හා ④න් දැක්වෙන භූ විෂමතා කලාප **දෙක** මොනවාදැයි පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) අංක ⑤ දරණ භූ විෂමතා කලාපයේ දැකිය හැකි භූ ලක්ෂණ **තුනක්** නම් කර, ඒවාට නිදසුන් **එක** බැගින් දක්වන්න. (ලකුණු 03 යි)

(iii) අංක ① දරණ භූ විෂමතා කලාපයෙහි සිදු කෙරෙන ආර්ථික කටයුතු **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

7. (i) ශ්‍රී ලංකාවේ තේ වගාව බහුලව ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්ක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) තේ වගාවට අවශ්‍ය භෞතික සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය හා අලෙවිකරණය සම්බන්ධ ප්‍රවණතා **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05 යි)

8. (i) ශ්‍රී ලංකාවේ,

(a) වැඩිම නාගරික ජන සංඛ්‍යාවක් ඇති දිස්ත්‍රික්කය ද

(b) වැඩිම ග්‍රාමීය ජන සංඛ්‍යාවක් ඇති දිස්ත්‍රික්කය ද පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ජන ව්‍යාප්තිය කෙරෙහි බලපා ඇති,

(a) භෞතික සාධකයක් ද

(b) ආර්ථික සාධකයක් ද

(c) සමාජයීය සාධකයක් ද පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) මෑතකාලීනව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහයෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

9. (i) වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජීවත්වන ආදිවාසීන් වර්ග තුනකි. ඉන් වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ආදිවාසීන් වාසය කරන ප්‍රදේශ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ජීවත්වන ආදිවාසී ජනතාවගේ ජීවන රටාව පැරණි ආදිවාසීන්ගේ ජීවන රටාවෙන් බොහෝදුරට වෙනස් වී ඇත. ඊට බලපා ඇති හේතු **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

* * *



Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர(சாதாரண தர) ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

විභාග අංකය / சுட்டெண் / Index Number ......................................

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத்துக்கு மட்டும் / For Examiner's Use Only

1. (අ) /(அ) /(a)

(i) ..............................................................................................

(ii) ..............................................................................................

(iii) ..............................................................................................

(iv) ..............................................................................................

(v) ..............................................................................................

(vi) ..............................................................................................

(vii) ..............................................................................................

(viii) ..............................................................................................

(ix) ..............................................................................................


(x) ..............................................................................................

/ 10


[නවවැනි පිටුව බලන්න

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

(ආ) /(ஆ) /(b)




(ඉ) /(இ) /(c)




1. (අ) (அ) (a) $\frac{\quad}{10}$ (ආ) (ஆ) (b) $\frac{\quad}{5}$ (ඉ) (இ) (c) $\frac{\quad}{5}$ = $\frac{\quad}{20}$

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

**OLD**


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 II**

4861

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
# கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
# General Certificate of Education (Ord. Level) Examination, December 2017

## භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II




SCALE 1 : 50 000

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/